# ධීවර අමාත්‍යාංශය

## විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | කේතය | ඇබෑර්තු ගණන | ඇබෑර්තු පවත්නා ප්‍රදේශය | වැටුප් පරිමාණය |
|---|---|---|---|---|---|
| 01 | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | MA2-1 2016 | 08 | උතුරු හා නැගෙනහිර පළාත් | 30,310-10X300-7X350-4X495-20X660-50,940 |

**01. ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී**

**සුදුසුකම් :**

කෘෂිකර්ම/ ජලජීවී වගා/ පශු සම්පත් පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් බලය පවරන ලද හා පිළිගනු ලබන ආයතනයක් විසින් නිකුත් කරන උක්ත ක්ෂේත්‍රයට අදාළ ඊට සමාන සහතිකයක් ලබා තිබීම.

**පොදු කොන්දේසි**

**වයස් සීමාව :**

| අනු අංකය | තනතුර | වයස් සීමාව |
|---|---|---|
| 01 | ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී | අවුරුදු 18 ට නොඅඩුවිය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |

**සටහන :** මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට සහ රජයේ ආයතන/ පළාත් පාලන දෙපාර්තමේන්තු / සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්හට අදාළ නොවේ.

රජයේ ආයතනවල / පළාත් පාලන දෙපාර්තමේන්තුවල/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුය.

- අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- තනතුරට අදාළ රාජකාරි නිසි ලෙස ඉටුකිරීමටත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි වන පරිදි වූ හොඳ මානසික හා ශාරීරික සුවතාවයකින් යුක්ත විය යුතුය. එසේම, මූලිකව පත් කරනු ලබන සේවා ස්ථානයේ අවම වශයෙන් වසර පහක (05) කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතුය.
- මනා චරිතයකින් යුක්ත විය යුතුය.
- උතුරු හා නැගෙනහිර පළාත්වල පදිංචි දමිළ භාෂාව සඳහා ප්‍රවීණත්වයක් ඇති අයදුම්කරුවන් හට ප්‍රමුඛතාවය හිමිවේ.

**ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබාදෙනු ලබන වෙනත් ප්‍රතිලාභ :**

- වෛද්‍ය ප්‍රතිලාභ
- රජයේ අනුමත කළ වෙනත් දීමනා
- සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාර අරමුදලේ සාමාජිකත්වය.

**ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් යොමු කරන විට පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.**

- ජීවදත්ත තොරතුරු
- සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සහතික කළ ඡායාපිටපත්

සියලු විස්තර පැහැදිලිව ඇතුළත් අයදුම්පත්, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කොට මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත, "**සභාපති, ශ්‍රී ලංකා ජාතික වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**

Source: Dinamina, Daily News (2021.07.08)